**සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)**

අපේක්ෂකයාගේ නම- ------------------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- ---------------------------------------------------------------------------------------
-----------------------------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට  අඩු  /  201-500  /   501 ට වැඩි

කොට්ඨාසය- ------------------------------------------------------------------------------------------------------

කලාපය-       ------------------------------------------------------------------------------------------------------

භාෂා භාවිතය හා අවබෝධය

11 ශ්‍රේණිය                                                                                     කාලය පැය 03 (මුළු ලකුණු 100)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

I **නාම විශේෂණ පද හා ක්‍රියා විශේෂණ පද යොදා වාක්‍ය 02ක් ලියන්න.**
II උපසර්ග පද යොදා අර්ථවත් වාක්‍ය 02ක් ලියන්න.
III කණ්ඨජ අක්ෂරවලින් ආරම්භ වන වචන 04ක් ලියන්න.
IV ක්‍රමෝපාය,මාර්ගීය,විද්‍යාලය,මහෞෂධ යන පදවල ඇතුළත් පිල්ලම් වර්ග නම් කර ලියන්න.
V විසර්ගය යෙදෙන පද 02ක් ලියන්න .

**(ලකුණු 2x5 = 10යි)**

**(02) පහත පදවල අර්ථ පැහැදිලි වන සේ එක් වචනයකට එක් වාක්‍ය බැගින් ලියා දක්වන්න.**

I තරග-තරඟ
II අඩ-අඬ
III අබ-අඹ
IV නුඹ-නුබ
V කණ-කන

**(ලකුණු 1x10 = 10යි)**

(03) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

I ගායකයෝ රසිකයින් අමන්දානන්දයට පත් කළහ.
II ක්‍රීඩකයෝ ප්‍රතිවාදීන් පරදා විශිෂ්ට ජයග්‍රහණ ලබති.
III කාර්මික ශිල්පීහු ආයතනයේ ප්‍රධානීන් අනුගමනය කරති.
IV මාර්ටින් වික්‍රමසිංහයෝ ගම්පෙරළිය රචනා කළහ.
V ශිෂ්‍යාව දිනපතා ගුරුවරුන් හමු වූවා ය.

**(ලකුණු 2x5 = 10යි)**

**(04)පහත දැක්වෙන වාක්‍ය සදොස් තැන් ඇතොත් නිදොස් කොට නැවත ලියන්න.**

I ගුරුවරු තරගයට සහභාගී වෙති'යි නිලධාරීන් අනුමාන කළේ ය.
II කාන්තාවෝ රැසවීමට පැමිණ නැත.
III ගායකයන් හා ගායිකාවෝ සංගීත රාත්‍රිය ආලෝකමත් කළහ.
IV ශෂ්‍යයන් සමග ශිෂ්‍යාවන් ද දේශනවලට සහභාගි වෙති.
V ඇය නම් සුරඟනක් වැනි ය.

**(ලකුණු 2x5 = 10යි)**

**(05) පහත දැක්වෙන පදවල ප්‍රකෘති සහ ප්‍රත්‍යය වෙන් කර ලියන්න.**

I පාලකයා ------------------------ VI දෙපාර්තමෙන්තුවේ ------------------------

II රාජ්‍යයෙහි ------------------------ VII ගැහැණියක ------------------------

III ගුණවත් ------------------------ VIII දේශපාලකයෙක් ------------------------

IV ශෛලමය ------------------------ IX සේනානායකයෝ ------------------------

V ගැටළුව ------------------------ X රජතමය ------------------------

**(ලකුණු 1x10 = 10යි)**

(06) තනි පද ලියන්න.

I මඩෙහි උපන්

II කාන්තාරයේ සාරවත් භූමිය

III ගවයන් රකින්නා

IV වනයේ ගස් එකට ඇතිල්ලීමෙන් හට ගන්නා ගින්න

V අශ්වයාගේ නාදය

**(ලකුණු 2x05 = 10යි)**

(07) පහත සන්ධි පද විසන්ධි කර අයත් වන සන්ධි වර්ගය ලියන්න.

I කටුවල

II වත්තල

III දේශාභිමානය

IV ඔවුනොවුන්

V ළිංපඩිය

**(ලකුණු 2x5 = 10යි)**

**(08)පහත දැක්වෙන වචන අකාරාදී පිළිවෙලට සකස් කරන්න.**

I නවකතා,කෙටිකතා,නාට්‍යය,කාව්‍යය

II අරලිය,ඇන්තූරියම්,අශෝක,ඇහැළ

III සිංහල,ප්‍රාකෘත,මාගධී,සංස්කෘත

IV අනුරාධපුර,පොළොන්නරුව,දඹදෙණිය,යාපහුව

V ගිරා සංදේශය,සැළලිහිණි සංදේශය,හංස සංදේශය,මයුර සංදේශය

**(ලකුණු 2x5 = 10යි)**

**(09)පහත ඡේදය වචන 40-50 අතර වන සේ සාරාංශ කර ලියන්න.**

ලෝකයේ වඩාත් බලවත් රාජ්‍යයන් මගින් කුඩා රාජ්‍යයන් යටත් කර ගැනීමේ මෙහෙයුම වන යටත්විජිතකරණයත් සමග ජනපදකරණය ද ආරම්භ වී ඇත. එමනිසා ලෝකය පුරා බටහිර යුරෝපීය රාජ්‍යයන් විශාල ලෙස පැතිර යාමට ද ජනපදකරණය හේතු වී තිබේ. බොහෝ විසිරුණු ජනපදවල ජනගහණයෙන් බහුතරය බටහිර යුරෝපීය පදිංචිකරුවන් බව හඳුනාගත හැකි ය. ඇමරිකාව, බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය යන රටවල් උදාහරණ වේ. මෙම රාජ්‍යයන් තුළ හා වෙනත් කුඩා දූපත්වල නැවත පදිංචි කිරීම් සිදු වූ අතර වගා බිම් මුල් කර ගනිමින් සිදු වූ ජනපදකරණය පිළිබඳ ව 19 වන සියවසේ දී මෙක්සිකෝවේ සාමාන්‍ය ජනපදකරණ නීතිය සහ එක්සත් ජනපදයේ සම්භාව්‍යය ඉරණම වැනි නීති පවා ලියවී ඇත. ඉතා ඈත ඉතිහාසයේ එනම් ග්‍රීසියේ සහ ෆිනීෂියාවේ ජනාවාස නොවූ ඉඩම්වල වගා කිරීම සඳහා ජනපද පිහිටුවීම සිදු විය. ගොවිතැන සඳහා සුදුසු ඉඩමක් බොහෝ විට දඩයම් කිරීම සහ එකතු කිරීම මගින් ජීවත් වූ සංක්‍රමණික ගෝත්‍රිකයන් විසින් අල්ලාගනු ලැබිණි. මේ අයුරින් ග්‍රීකයන් සහ ෆිනීෂියානුවන් මධ්‍යධරණී හා මැද පෙරදිග ප්‍රදේශවල වෙළඳාම නියාමනය කිරීමේ හා ව්‍යාප්ත කිරීමේ අරමුණින් ජනපද පිහිටුවීම සිදු කොට ඇත. අතීතයේ රෝමයේ ද ජනපදකරණය සිදු වී ඇත. යුරෝපයේ වර්තමාන නගර බහුතරයක් ආරම්භ වූයේ ද රෝම යටත්විජිත කොලනි හෙවත් රෝම ජනපද ලෙස ය.

**(ලකුණු 10යි)**

(10)පහත දැක්වෙන කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මුලදි කැළේ හැටි බැලුවම කුමක් වැනි
පිහිය නුදුටු අපෙ මාමගෙ රැවුල වැනි
හේන කොටා ගිනි තිබ්බම කුමක් වැනි
මගුල දවසෙ එළි කළ මගෙ මූණ වැනි

කුරක්කනේ පොඩි පැල්පත කුමක් වැනි
විසි වයසේ මගෙ කම්මුලෙ පෙනුම වැනි
පීදීගෙන එන කුරහන් කුමක් වැනි
අලුත් ළමිස්සියකගෙ මල් හිනා වැනි

I මේ කවි පෙළින් කියවෙන්නේ කුමන වගාවක් පිළිබඳ ව ද?

II ' මුලදි කැළේ හැටි බැලුවම කුමක් වැනි
පිහිය නුදුටු අපෙ මාමගෙ රැවුල වැනි'

මෙහි උපමාව සහ උපමේය වෙන් කර දක්වන්න.

III කවියා භාවිත කොට ඇති කාව්‍යාලංකාර 02 ලියන්න.

IV මෙහි සඳහන් උපමාලංකාර 02ක් ලියන්න.

V කවියා දක්වන ගොවියා තරුණයෙකු බව පවසන කවි පදය කුමක්ද?

(ලකුණු 2x5 = 10යි)